# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2489/48 - 2026 මැයි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2026.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග**

01. තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන අතර එකී ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලනයන්හි පරිපාලනය හා වෙනත් යම් අවැසි කටයුතු යථායෝග්‍ය අයුරින් ඉටු කිරීම උදෙසා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධන අනුව සහ ඒ යටතේ නිකුත් කරන ලද විධිවිධාන අනුව **පවතින ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරගැනීම සඳහාත්, නව නිලධාරීන් පත්කර ගැනීම සඳහා වූ නිලවරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරගැනීම සඳහාත් යනාදී සීමිත කාරණා සඳහා** 2026 මැයි මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි **තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා** නිසි බලධාරියා ලෙස මෙයින් පත් කරමි.

**01.** අත් පන්දු
**02.** කැරම්
**03.** හොකී

02. මම මෙයින්, ඉහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි සංශෝධිත ව්‍යවස්ථාව යටතේ වාර්ෂික මහ සභා රැස්වීමකදී පැවැත්වෙන නිලවරණයකදී සිය නිලධාරීන් තෝරා පත්කරගන්නා තෙක්, ඉහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනයන්හි කාර්යයන් කරගෙන යාම සහ කළමනාකරණය කිරීම සඳහා ඉහත කී **තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා** වෙත බලය පවරා දෙමි.

**සුනිල් කුමාර ගමගේ** (පා.ම.),
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය.

2026 මැයි මස 19 වැනි දින,
කොළඹ දීය.

EOG 05 - 0219